www.wsws.org
ලෝක සමාජවාදී වෙබ් අඩවිය
හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# ශ්‍රී ලංකාවේ සමාජවාදී සමානතා පක්ෂය කොළඹ දී මැයි දින රැස්වීමක් පවත්වයි

## Sri Lankan Socialist Equality Party to hold May Day meeting in Colombo

**2006 අප්‍රේල් 24**

ශ්‍රී ලංකාවේ සමාජවාදී සමානතා පක්ෂය (සසප) මෙවර මැයි දින සැමැරීම සඳහා කොළඹ දී ප්‍රසිද්ධ රැස්වීමක් පවත්වයි. අද දින ජාත්‍යන්තර කම්කරු පන්ති ඒකාබද්ධතාවය ක්ෂනික ප්‍රායෝගික අවශ්‍යතාවක් බවට පත්ව තිබේ. අත ලඟටම පැමින ඇති යුද්ධයේ තර්ජනයන්ට ද ගැඹුරුවන්නා වූ සමාජ අසමානතාවයට ද සමාජවාදී විසඳුමක අවශ්‍යතාව මෙම රැස්වීමේ කථිකයන් විසින් ඉස්මතු කෙරෙනු ඇත.

මෙම වසරේ මැයි දිනය පැවැත්වෙන්නේ ඇමරිකා එක්සත් ජනපද ආන්ඩුව ඇෆ්ඝනිස්ථානය හා ඉරාකය යටත් කර ගැනීමෙන් පසු ඉරානයට එරෙහිව ද ඉවබව නැති මිලිටරි ආක්‍රමනයකට සැරසෙමින් සිටින තතු තුල ය. පෙන්ටගනය හා ධවල මන්දිරයේ දී ඉරානයට එරෙහි පූර්න-පරිමාන ප්‍රහාරයක් සඳහා පිඹුරුපත් දැනටම සැකසී ඇත; මෙම ප්‍රහාරයට න්‍යෂ්ටික අවි ද යොදාගනු ඇත.

දකුනු ආසියාව පුරා ම කම්කරු පන්තිය සිය ප්‍රජාතන්ත්‍ර අයිතීන්ට ද ජීවන තත්වයන්ට ද එරෙහි උග්‍රවන ප්‍රහාරයන්ට මුහුන දී සිටී. ලේවැකි සිවිල් යුද්ධය අලුත් කිරීමේ තර්ජනයට වැඩ කරන ජනතාව මුහුන දී සිටින ශ්‍රී ලංකාවේ දී මෙම දේශපාලන හා ආර්ථික අර්බුදය අතිශය තීව්‍ර භාවයක් අත් කර ගනී. දිවයිනේ යුද කලාපවල ප්‍රචන්ඩ ක්‍රියා දිනෙන් දින උග්‍රවන තතු තුල ජිනීවා සාම සාකච්ඡා බිඳ වැටීම ආසන්න ය.

ම්ලේච්ඡත්වය කරා මෙම ඇදවැටීම වැලැක්වීමට සමත් එකම සමාජ බලවේගය නම් ජාත්‍යන්තර කම්කරු පන්තිය යි. තීරනාත්මක ප්‍රශ්නය වන්නේ කම්කරු පන්තියේ අරගලයන් ඒකාබද්ධ කොට මෙහෙයවීම සඳහා සමාජවාදී ඉදිරි දර්ශනයක් හා ක්‍රියා මාර්ගයක් වර්ධනය කර ගැනීම යි. ලෝසවෙඅ පාඨකයන්, කම්කරුවන්, තරුන ජනයා හා බුද්ධිමතුන් අපගේ රැස්වීමට සහභාගීව මෙම ප්‍රානභූත ප්‍රශ්නයන් සාකච්ඡා කිරීමට සම්බන්ධ වන ලෙස අපි ඉල්ලා සිටිමු.

**දිනය හා වේලාව : මැයි 1 දින සවස 3.00ට**

**ස්ථානය: නව නගර ශාලාව, කොළඹ.**

**ප්‍රධාන කථිකයා: සසප ප්‍රධාන ලේකම් විජේ ඩයස්**

© www.wsws.org